Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සති පාසල

විෂය - මව්බස

2021 සැප්තැම්බර් 13 සිට සැප්තැම්බර් 20 දක්වා සතිය

සතිය - 20

ශ්‍රේණිය :- 4

සැකසුම :- ඩබ්.කේ.ටී.මධුෂා මිය /ර/ඇඹි /තුංකම ම.වි. 4 ශ්‍රේණිය බාර

දුවේ පුතේ .... පහත ඡේදය කියවන්න.

**මගේ යහළුවා**

මගේ යහළුවාගේ නම සුරංග ය. සුරංග බොහෝ අහිංසක කෙනෙකි. ඔහු සැම විට ම මට උදවු කරයි. මා අසනීප වූ විටෙක සුරංග මා බැලීමට එයි. මගේ පාඩම් වැඩ අතපසු වූ විට ඔහු මට ඒවා කියා දෙයි. ඔහු හොඳ මිතුරෙකු බව අම්මා පවසයි. මම ඔහුගේ දියුණුව ප්‍රාර්ථනා කරමි.

ඡේදයෙන් "මගේ යහළුවා" වන "සුරංග" පිළිබඳ ව යි.

මගේ යහළුවා වන "සුරංග" යනු පුරුෂලිංග, ඒකවචන නාමපදයකි.

ඡේදයේ ඇතුළත් සැම වාක්‍යයකින් ම කියවෙන්නේ සුරංග පිළිබඳ ව යි.

එහි දී සැම වාක්‍යයක් ම 'සුරංග' යැයි සඳහන් නොකර 'ඔහු' ලෙස යොදා ඇත.
ඡේදයේ එම වචනවලට යටින් ඉරක් අඳිමින් එම පැහැදිලි කිරීම තව දුරටත් සිදු කරන්න.

ඒ අනුව සුරංග යැයි සැම වාක්‍යයක ම සඳහන් කිරීමෙන් වාක්‍ය නිරස වේ, ඒ සඳහා ඔහු යන්න යෙදීමෙන් ඒකාකාරී වාක්‍ය රටාවෙන් මිදීමට සමත් වේ.

මෙලෙස පුරුෂලිංග, ඒකවචන නාම පදයක් භාවිත කරන අවස්ථාවල එම නාම පදය සැම විට ම යෙදීම නොකර ඒ වෙනුවට 'ඔහු' යන පුරුෂලිංග, ඒකවචන පදය භාවිත කළ හැකිය.

උදා:- තාත්තා උදෙන් ම අවදි වෙයි.

ඔහු රැකියාවට පිටත් වෙයි.

මෙවන් වාක්‍ය සිසුන්ට ලබා දී කියවීමට අවස්ථාව දෙන්න.

- **ඔබත් පහත සඳහන් තීරුවල වාක්‍ය 10 යුගල බැගින් ලියන්න**

1)..........................................................................................................................
..........................................................................................................................
2)..........................................................................................................................
..........................................................................................................................
3)..........................................................................................................................
..........................................................................................................................
4)..........................................................................................................................
..........................................................................................................................
5)..........................................................................................................................
..........................................................................................................................
6)..........................................................................................................................
..........................................................................................................................
7)..........................................................................................................................
..........................................................................................................................